**කින්නියා නගර සභාව - 2021**

**--------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**----------------------------------**

කින්නියා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කින්නියා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**--------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

**------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කළ මූලධන වියදම් ලැයිස්තුවේ එකතුව සහ ආදායම් හා වියදම් ගිණුමේ දක්වා තිබූ ප්‍රදාන වියදම් අතර රු. 410,073ක වෙනස්කම් නිරීක්ෂණය විය. | වරද පිළිගන්නා ලදි. | නිවැරදි වටිනාකම ගිණුම්වල දැක්වීමට පියවර ගත යුතුය. |
| (ආ) | ඉකුත් දෙසැම්බර් මස වැටුප් ප්‍රතිපූර්ණ මුදල සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස දැක්වීම සහ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූරණ මුදල අඩුවෙන් දැක්වීම නිසා සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ආදායම් ප්‍රදාන/අතිරික්තය රු.578,037 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | දෝෂ පිළිගන්නා ලදි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සභාවේ අවසන් ගිණුම්වල ජංගම නොවන වත්කම්වල එකතුව රු.145,790,939ක් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය, ඉඩම් හිමිකම් ඔප්පු සහ විස්තරාත්මක ලැයිස්තු ආදිය කළමනාකරණය විසින් විධිමත්ව පවත්වා නොතිබුණි. මේ නිසා, මේවායේ භෞතික පැවැත්ම විගණනයේදි තහවුරු කළ නොහැකි විය. | මේ පිළිබඳව දත්ත පද්ධතියක් (Data Base) ස්ථාපිත කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | නියමිත ලේඛන විධිමත්ව පවත්වාගෙන යාමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | විස්තරාත්මක ලැයිස්තු, ලේඛන, ලෙජර හා ශේෂ සනාථ කර ඉදිරිපත් නොකිරීම ගිණුම් විෂයයන් 03 කට අදාළ රු.18,403,832 ක් සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | සඳහන් කරනු ලැබූ දෝෂ පිළිගනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල පවතින දෝෂ සනාථ කිරීමට පියවර ගතයුතුය. |

### 1.6.3 නොසැසඳුනු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූලධන ආදායම් සහ මූලධන ආදායම් ලැබීම් ලැයිස්තුව අතර රු.856,188ක වෙනසක් හඳුනාගෙන තිබුණි. | දෝෂ පිළිගන්නා ලදි. | නිවැරදි වටිනාකම ගිණුම්වල දැක්වීමට පියවර ගත යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**-----------------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

**---------------------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි කාලයේ පිළියෙල කිරිමට පියවර ගෙන ඇත. | වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) 1987 නගර සභා ආඥා පනතේ 255 පරිච්ඡේදයේ 44 වගන්තිය | නගර සභා බලප්‍රදේශයට අයත් මාර්ගවල විස්තර භාෂාත්‍රයෙන්ම සකස් කර ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර නොතිබුණි. | වර්තමානයේ මේ සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | පනතේ විධිවිධානවලට අනුව පියවර ගත යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1646 | සභාවේ භාවිතයේ පවතින වාහනවල දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශවල මුල් පිටපත් මාසිකව ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම විගණනයට යවා නොතිබුණි. | ඉදිරි කාලයේදි නිසි අයුරින් යවනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය වෙනුවෙන්වූ සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම (Annual Action Plan), චක්‍රලේඛ ප්‍රකාරව සියළුම ක්‍රියාකාරකම් ඇතුළත් කර පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදි වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම ක්‍රියාත්මක කිරිමට ඉදිරි පියවර ගනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහනයක ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කිරිම සමාලෝචිත වර්ෂයේදි සිදුකර නොතිබුණි. | වර්තමානයේ මේ සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන පරිභෝජන පරීක්ෂාව සිදුකළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**------------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

**-------------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.5,021,055ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 2,146,961ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පැවැති හිඟහිටි වරිපනම් හා බදු රු.5,294,267ක් අයකර ගැනීමට සභාව විසින් ඵලදායි පියවර ගෙන නොතිබුණි. | හිඟහිටි වරිපනම් හා බදු සම්බන්ධයෙන් රටෙහි වර්තමානයේ පවතින තත්ත්වය සහ රටේ පවතින වසංගත රෝගය හේතුවෙන් අපට ක්‍රියාමාර්ග ගත නොහැකිව තිබේ. | හිඟහිටි වරිපනම් හා බදු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය |
| **(ආ) බදු කුලී ආදායම්** | | |
| නගර සභාව විසින් පොදු වෙළෙඳ පොල සහ මස්කඩ වාර්ෂිකව බදුදීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.36,315,069ක් හිඟහිටිව පැවැතුණද, වර්ෂ 05කට අධික කාලයක සිට පැවැති දීර්ඝකාලීන හිඟහිටි මුදල් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | නගර සභාවේ හිඟබදුකුලි අයකර ගැනීම සඳහා නීති ක්‍රියාමාර්ග ගෙන අදාල කටයුතු සිදුකරමින් පවතී. | හිඟහිටි බදුකුලි අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**කාර්යසාධනය**

නගර සභා ආඥා පනතේ 4 වැනි වගන්තිය අනුව**,** මහජන සෞඛ්‍යය, මහජන උපයෝගීතා සේවාවන් සහ පොදු මංමාවත් සහ මහජන සෞඛ්‍යය, පහසුකම් සහ සුභසාධනය ආදී සභාවෙන් ඉටුකළ යුතුව තිබූ කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කින්නියා සහ කුරිඤ්ඤාකේනිහි අනතුරු සිදු වූ බෝට්ටු සේවාව සඳහා අනුමැතිය, සභාවේ සභාපතිවරයා විසින් 2021 ඔක්තෝබර් 28 දිනැති ලිපිය මගින් ලබාදී තිබුණි. ඒ පිළිබඳ සභාවේ තීරණ, ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ ලිපිලේඛන කිසිවක් නඩත්තු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් නඩු විභාග වෙමින් පවතින නිසා අදහස් දැක්වීමට නොහැකිය. | සේවාවන් ඉටු කිරීමේදී ඒ සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඒ අනුව සභාව විසින් නියමිත කාර්යයන් ඉටු කළයුතුය. |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. 519,585ක් වූ පරිගනක 03ක් මිලදී ගැනීමේදී 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර නොතිබුණි. එසේම, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.2(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව සැපයුම් අවසාන කළයුතු කාලයද මිලදී ගැනීමේ ඇණවුමේ සඳහන් කර නොතිබුණි. | වරද පිළිගන්නා ලදි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන ආචාරධර්මවලට පටහැනි ලෙස සභාවේ නිලධාරියෙකු සභාපතිකම දරන අනුමත සමිතියක් වෙත රු.මිලියන 2.57 ක් වටිනා කාර්යයන් 04 ක් පවරා තිබුණි. | ඉදිරි කාලයේදී මෙම දෝෂය සිදුනොවන පරිදි නිවැරදි කරගනු ලැබේ. | අදාල පනත් විධිවිධානවලට අනුව ක්‍රියාමාර්ග ගතයුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 සහ ඇප මුදල් ආඥාපනත (පරිච්ඡේදය 612) ප්‍රකාරව ඇප මුදල් තැන්පත් කළයුතු නිලධාරින්ගෙන් ඇප තැන්පතු ලබාගෙන නොතිබුණි. | ඇප මුදල් ලබාගැනීමට කටයුතු කළ යුතුය. | පනතේ විධිවිධාන සහ මුදල් රෙගුලාසි ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 25 දිනැති අංක **PT/14/2021** දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන 2021 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළයුතු බව සඳහන් වූවත්, සභාව විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2021 මැයි 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | ඉදිරිකාලයේදී නියමිත කාලයේ පිළිතුරු යැවීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර තිබුණද 2019 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන සැලැස්ම සහ විගණන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | දක්ෂ නිලධාරියෙකු පත්කල විට ඔහුව අභ්‍යන්තර විගණකවරයා ලෙස අනුයුක්ත කෙරේ. | ඉදිරි කාලයේදි ඉතාමත් ප්‍රශස්ථ අයුරින් අභ්‍යන්තර විගණනය සිදුකිරීමට කටයුතු කළ යුතුය. |

## 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැයගත පුනරාවර්තන වියදම් සහ තථ්‍ය පුනරාවර්තන වියදම් අතර රු. 2,578,624 මිලියන සිට රු.25,151,529 මිලියනක් දක්වා වෙනස්කම් නිරීක්ෂණය වූ බැවින් අයවැය වූ කලි කළමනාකරණයේ ඵලදායි පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය විය. | ප්‍රශස්ථ අයවැයගත ගිණුම්කරණ ක්‍රියාවලියක් ඉදිරියේදි සිදුකරනු ලැබේ. | ඵලදායි අයුරින් අයවැය සැකසීමට කටයුතු කළ යුතුය. |

## 4.4 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන අරමුණු පනත ප්‍රකාරව, 2030 වර්ෂයේ ළඟාකර ගතයුතු තිරසාර සංවර්ධන අරමුණුවල ළඟාවීමේ මට්ටම පිළිබඳව නිවැරදි තක්සේරු කිරීම් සහ දර්ශක හඳුනාගෙන සභාවේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු පවත්වා නොතිබුණි. | වෙනමම කාර්යසාධන වාර්තාව පවත්වාගෙන යාමට පියවර ගනු ලැබේ. | දර්ශකයන් පිළිබඳ තොරතුරු ඵලදායි අයුරින් පවත්වාගෙන යාමට පියවර ගත යුතුය. |